# අලි කුලප්පුව



විශ්මි ආකර්ෂා ජයසුන්දර

# පිදුම

මා වෙනුවෙන්

නිරතුරුවම සෙවනැල්ලක්

මෙන් ළඟ රැදෙන

අම්මාට හා තාත්තාට

ISBN NUMBER=978-624-206-903-6

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

අම්මයි අක්කයි එක්ක මම දවසක් පෙරහැර බලන්න ගියා. එදා දවසේ හොඳට අවුව පායලා තිබුණා. මාළිගාව ළඟ මිනිස්සු පිරිලා. අපි නුවර වැව අයිනේ තැනකට වෙලා පෙරහැර එනතුරු බලාගේන හිටියා. ටික ටික අවුව බැහැලා ගිහින් කළුවර වැටීගෙන ආවා. එත කොට දළඳා මාළිගාවේ හැමතැනම තරු කැට වගේ විදුලි එළි දැල්වුණා.



වැව රවුමේ ගස්වලත් පාට පාටින් විදුලි එළි දැල්වුණා. අහසේ හඬ පායාගෙන ආවා වෙඩිල්ලක හඬක් ඇහුණා. එතකොටම ඇතින් චට පට ගාලා කස පුපුරවන සද්දයක් සමඟ පෙරහැර පටන් ගත්තා.







කසකාරයන් පස්සේ ගිනි බෝල කරකවන්නන් ආවා ලස්සනට සැරසුනු ඇතාගේ පිට උඩ ඉලා අම්මා කීවා. ඉන්නේ පෙරමුණෝරාල කිය




ඒ පසුපස්සේ නළාකරුවෝ, බෙරකරුවෝ, නැටුම් කණ්ඩායම් පේළියට ආවා ඉළඟට ආපු ඇතා උඩ හිටියේ ගජනායක නිලමේ. අන්තිමට ආවේ කරඬුව ගෙනියන ඇතා. ඒ ඇතා ලස්සනට සරසලා තිබුණා.




ඇතාගේ පිට උඩ කරඬුවත් ඇඳුමත් විදුලි බුබුළු වලින් දිළිසුණා. මිනිස්සු නැගිටලා සාදුකාර දුන්නා. දෙපැත්තේ තවත් ඇතුන් දෙදෙනෙක් ගමන් කළා.



ටික වේලාවකට පස්සේ අපිට කලබලයක සද්දයක් ඇහුණා. අපි දැක්කා අලියෙක් හයියෙන් දුවනවා මිනිස්සුත් ඒ පස්සෙන් දුවනවා. දුවපු අලියාගේ ඇඳුම් ගැළවුණා. පිට උඩ හිටපු කෙනෙක් බිමට වැටෙනවා මම දැක්කා.



අලි කුලප්ප වෙලා කියමින් මිනිස්සු දිව්වා. අලියාගේ වලිගයේ දෙනෙක් එල්ලිලා හිටියා. සමහරු වැවටත් වැටුණා.



කලබලෙන් දුවපු තවත් අලියෙක් ගසක බැන්දා පෙරහැර බලබලා හිටපු තවත් අය  ඇඬුවා අපිත් බය වුණා. ඊට පස්සේ  පෙරහැර නතර වුණා.



"අම්මා මාව වඩා ගත්තා. අක්කාගේ අතින් අල්ලා ගෙන ඉක්මනින් ගෙදරට ආවා.අලි කුලප්පුවේ කතාව අපි තාත්තාට කිවුවා.



මීට පස්සේ සෙනඟ ඉන්න තැන්වලට යනකොට ගොඩාක් පරිස්සම් වෙන්න ඕනෑ කියලා තාත්තා අපට අවවාද කළා.

නිමි

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

ISBN NUMBER=978-624-206-903-6